# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1818/19 - 2013 ජූලි මස 10 වැනි බදාදා - 2013.07.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත**

2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 117(ඛ) වගන්තිය ප්‍රකාර සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව පනවනු ලබන නියෝගය.

පියංකර ජයරත්න (පා. ම.),
සිවිල් ගුවන් සේවා අමාත්‍ය.

2013 ජූලි මස 05 වැනි දින,
කොළඹ 01.

රෙගුලාසි

1. මෙම රෙගුලාසි මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපලෙහි ගගන යාත්‍රාංගනය පරිහරණය කිරීම වෙනුවෙන් අය කරනු ලබන ගාස්තු වශයෙන් හඳුන්වනු ලබන අතර නිකුත් කරනු ලබන දින සිට බලාත්මක වේ.

2. මෙම රෙගුලාසි මගින් අංක 1801/38 සහ 2013 මාර්තු 15 දිනැතිව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රය* මගින් පළකරන ලද රෙගුලාසි අවලංගු කරනු ලැබේ.

3. සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අභිමතය පරිදි ලිඛිතව නිදහස් නොකරන්නේ නම්,

   මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපල වෙත පැමිණෙන සෑම ගුවන් යානයක්ම පහත දැක්වෙන ගොඩබෑසීම් ගාස්තු සහ නැවතුම් ගාස්තු ව්‍යවස්ථාපිත සේවා සපයන්නා වෙත ගෙවිය යුතු ය.

| | | |
|---|---|---|
| 01. | ගොඩබෑසීම් ගාස්තු | එක් ගොඩබෑසීමක් සඳහා ගුවන් යානයේ උපරිම ඉගිලුම් බරින් සෑම කිලෝග්‍රෑම් දහසකට හෝ ඉන් කොටසකට එක්සත් ජනපද ඩොලර් හතර (4) බැගින් |
| 2. | නැවතුම් ගාස්තු | ගොඩ බෑසීමෙන් පසු ප්‍රථම පැය තුනක (3) කාලයකට වැඩිමනත්වන සෑම පැය හයක (6) කාලසීමාවක් හෝ ඉන් කොටසක් සඳහා අදාළ ගොඩබෑසීම් ගාස්තුවෙන් සියයට දහයක් (10%) |

4. කෙසේ වෙතත් ඉහත "3" ජේදයෙහි දැක්වෙන ගොඩබැසීම් සහ නැවතුම් ගාස්තු, සීමිත ගුවන් මෙහෙයුම්කරුවන් වෙත විශේෂ වට්ටම් ප්‍රතිශත, අදාළ ගොඩබැසීම් සහ නැවතුම් ගාස්තු වෙනුවෙන් පහත පරිදි වහාම ක්‍රියාත්මක වන පරිදි ප්‍රදානය කරනු ලැබේ.

| සාමාන්‍ය ගාස්තු සඳහා අදාළවන විශේෂ වට්ටම් ප්‍රතිශතය | | | |
|---|---|---|---|
| කාල පරිච්ඡේදය | 18/3/2013-17/3/2014 | 18/3/2014-17/3/2015 | 18/3/2015-17/3/2016 |
| ගොඩබැසීම් සහ නැවතුම් ගාස්තු | 50% | 25% | 25% |

ඉහත සඳහන් සීමිත ගුවන් මෙහෙයුම්කරුවන් වන්නේ :

(අ) නව කුලී ගුවන්යානා මෙහෙයුම්කරුවන්

(ආ) නව අඩු පිරිවැය ගුවන් සේවා සපයන ගුවන් සමාගම්

(ඇ) මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපලට ඕනෑම අතිරේක ගුවන් ගමන්වාර ගණනක් වැඩිකර ගැනීම සඳහා දැනටමත් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ මෙහෙයුම් සිදු කරන අඩු පිරිවැය ගුවන් සේවා

(ඈ) මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපලට ඕනෑම අතිරේක ගුවන් ගමන්වාර ගණනක් වැඩිකර ගැනීම සඳහා දැනටමත් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ මෙහෙයුම් සිදු කරන පූර්ණ සේවා සපයන ගුවන් සමාගම්

(ඉ) නව පූර්ණ සේවා සපයන ගුවන් සමාගම්

07-754

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.